කොටපොල ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය
---------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල්04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කොටපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට වරිපනම් හා කුලී වෙනුවෙන් ඉදිරියට ලැබූ රු.28,495 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල නොදක්වා හිඟ මුදලට හිලව්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල රු.2,027,316 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ වරෙන්තු ගාස්තු හා දඩ අය ශීර්ෂයට බැර කර තිබුණේ රු.811,886 ක් පමණක් වූයෙන් රු.1,215,430 ක මුදලක් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) 2013 මාර්තු 15 දින මිලදී ගෙන තිබූ උපකරණ වල වටිනාකම වූ රු.81,480 න් රු..31,480ක මුදලක් පමණක් වර්ෂය තුල ගෙවා තිබුණ අතර නොගෙවා තිබූ රු.50,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමට හර කර ණය හිමියන් ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඈ) වීථි පහන් නඩත්තු කිරීම සඳහා 2013 වර්ෂයේදී නඩත්තුකරු දීමනා ලෙසට ගෙවා තිබුණු රු.35,800 ක මුදල වැටුප් හා දීමනා වැය ශීර්ෂයට හර නොකර ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යක හා වෙනත් සේවා වැය විෂයට හර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන යටතට නොගැනෙන රු.518,682 ක් වටිනා ගිණුම් ශේෂ හතරක් ආයෝජන ලෙසට ගිණුම්ගත කර තිබුණි.

1.3.4 නොසැසඳු පාලන ගිණුම

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් හතරක එකතුව රු.44,083,088 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව එකී ගිණුම් ශේෂ වල එකතුව රු.32,651,343 ක් වූයෙන් වෙනස රු.11,431,745 ක් විය.

1.3.5 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයේ ශේෂ පත්‍රයේ දැක්වෙන රු.1,154,043 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,272,118 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,317,103 ක් විය.

1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.23,040,565 ක් වටිනා ගිණුම් විෂයයන් 05 ක් සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.8 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,596,838 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,070,615 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,093 | 1,017 | 461 |
| කුලී | 4,451 | 5,115 | 1,160 |
| වෙනත් ආදායම් | 26 | 25,672 | 44,670 |

2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.271,334 ක උසාවි දඩ ලැබිය යුතුව තිබුණි.

2.2.2 ජල ගාස්තු

සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිය මගින් ජල පහසුකම් සැපයූ ජල පාරිභෝගිකයන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.687,149 ක මුදලක් අයවීමට තිබුණි

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) වීථි පහන් නඩත්තු ආධාර ප්‍රතිපූර්ණය කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම් ගතවී නොතිබීම හේතුවෙන් 2009 සිට 2013 වර්ෂ සඳහා රු.162,648 ක මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබූ අතර, 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 හා 2010 අංක 17 දරන විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 1.2 ඡේදය කෙරේ සභාව අවධානය යොමුකර නොතිබුණි.

(ආ) දෙනියාය සිනමා ශාලාවකින් 1995 වර්ෂයේ මැයි මාසයේ සිට 2005 ජූලි මාසය දක්වා වූ වර්ෂ 10 ක කාල පරිච්ඡේදය තුල සභාවට අයවීමට තිබූ රු.419,132 ක විනෝද බදු වටිනාකම අයකර ගැනීමට නඩු පවරා තිබුණද සභාවේ නියෝජිතයන් නඩු වාර සඳහා පෙනී නොසිටී බැවින් මෙම නඩුව අධිකරණය විසින් නිෂ්ප්‍රභා කර තිබූ අතර හිඟ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 01 | - | 01 | |
| තෘතියික | 01 | 02 | | 01 |
| ද්විතියික | 19 | 16 | 03 | |
| ප්‍රාථමික | 41 | 36 | 05 | |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 09 | | 09 |
| | 62 | 63 | 09 | 10 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.11,205,500 ක් මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වියදම රු.16,514,894 ක් වූයෙන් සභා අරමුදලට රු.5,309,394 ක අතිරේක වැය බරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------

4.1 ක්‍රියාකාරී සැලැස්ම
----------------------
සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------
සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------
සමාලෝචිත වර්ෂය සඳහා 2006 ජනවාරි 25 දිනැති අංක පී.ප්‍ර.නි./ප්‍ර.වි.නි./18 දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලන
------------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ගබඩා පරිපාලනය